# ගම්පහ, අස්ගිරිය රජමහා විහාරයේ මහනුවර යුගයට අයත් ලෙන් සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

එන්.එස්.යු. නැලිගම

දෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය


*Sajirauneligama@gmail.com*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉපැරණි ලෙන් සිතුවම් පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී වැදගත් වන ස්ථාන කිහිපයක් සියනෑ කෝරලයෙන් හමුවේ. ඒ අතර අස්ගිරිය රාජමහා විහාරය පෞරාණික මෙන් ම කලාත්මක වශයෙන් වැදගත් තොරතුරු අනාවරණය කරන විහාරස්ථානයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම විහාරස්ථානයේ සිදුකරන ලද කඩිනම් ගවේෂණයක් මඟින් ක්ෂේත්‍රයේ ඇති මහනුවර යුගයේ ලෙන් සිතුවම් පිළිබඳ ව වාර්තා කිරීමත්, එම ක්ෂේත්‍රය පිළිබඳව වාර්තා කිරීමත් මෙමඟින් අපේක්ෂා කෙරේ.

## ක්ෂේත්‍රයේ පිහිටීම

මහනුවර යුගයට අයත් ලෙන් සිතුවම් සහිත මෙම විහාරස්ථානය බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අස්ගිරිය ග්‍රාමනිලධාරි වසමේ පිහිටා ඇත. නිරපේක්ෂ ස්ථානගත පිහිටීම අනුව උතුරු අක්ෂාංශ 07°06'39.6'' හා නැගෙනහිර දේශාංශ 79°59'22.7'' අයත් වේ. ගම්පහ මිනුවන්ගොඩ මාර්ගයේ කිලෝමීටර් තුනහමාරක් පමණ ගියවිට හමුවන බුලත් කඩේ හන්දියෙන් දකුණු දෙසට ඇති දොරණෑගොඩ මාර්ගයේ මීටර් සියයක් පමණ ගියවිට ක්ෂේත්‍රයට පිවිසිය හැකි ය.



**සිතියම් අංක 01; (ගම්පහ දිස්ත්‍රික් සිතියම)**

## ක්‍රමවේදය

අස්ගිරිය රාජමහා විහාරයේ පවතින මහනුවර යුගයට අයත් ලෙන් සිතුවම් පිළිබඳ ව අධ්‍යයනයේ දී දත්ත රැස්කිරීම සඳහා ක්‍රමවේද කිහිපයක් භාවිතා කරන ලදී මූලික ව ක්ෂේත්‍රය හඳුනාගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් කර ඇති පූර්ව අධ්‍යයන හඳුනාගැනීම, සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීම, ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා, පුස්තකාල ගවේශනය හා අන්තර්ජාල

පරිශීලනය තුළින් ද මෙම විහාරස්ථානය පිළිබඳ ව තොරතරු සටහන් කරගැනීමක් සිදුකරන ලදී,

## පූර්ව අධ්‍යයන


අස්ගිරිය රජමහ විහාරයේ ලෙන් සිතුවම් පිළිබඳ ව අධ්‍යයනය කරන ලද පර්යේෂකයන් අතර සේනක බණ්ඩාරනායක මහතාගේ සහ රාජ් සෝමදේව මහතාගේ හැදෑරීම් සුවිශේෂී ය. (බණ්ඩාරනායක, සෝමදේව, 1999:239,237) අස්ගිරිය ලෙන් විහාරය මුල් ඓතිහාසික යුගයට අයත් ගිරිවිහාරයක් බවත්, එහි සිතුවම් මහනුවර යුගයේ චිත්‍ර ශෛලියේ අඛණ්ඩ කථන ක්‍රමයට නිර්මාණය කර ඇති බවත් සේනක බණ්ඩාරනායක හා රාජ් සෝමදේව ප්‍රකාශ කර ඇත (බණ්ඩාරනායක, සෝමදේව, 1999: 239, 237). ඩබ්ලිව්.ඩී.සී. බුද්ධිකා මෑත කාලීන ව මෙම ලෙන් විහාරයේ සිතුවම් පිළිබඳ හදාරා ඇත (බුද්ධිකා 2014:23).

## ඓතිහාසික පසුබිම

මෙම විහාරස්ථානයේ ඓතිහාසික පසුබිම පිළිබඳ ව තොරතුරු පිරික්සීමේ දී පොදුවේ පවතින ජනප්‍රවාදය වනුයේ සොළී ආක්‍රමණ හමුවේ පලාගිය වළගම්බා රජු අස්ගිරියේ සැගවී සිට සොළීන් පලවා හැර නැවත රජ වූ පසු ව මෙම ලෙන් විහාරය ඉදිකරන්නට ඇතැයි ජනප්‍රවාදයේ එයි. මහනුවර යුගයේ දී මෙම විහාරස්ථානයෙහි වස් විසීම සඳහා පැමිණි ධම්මදස්සි නම් හිමියන් විසින් වර්තමානයේ දක්නට ඇති ලෙන් සිතුවම් හා ප්‍රතිමා ඉදිකරවන්නට ඇතැයි සැලකේ (බුද්ධිකා, 2014:26). උඩුගම්පොල ප්‍රාදේශීය රාජධානියේ රජ කල සකළකලාවල්ලභ රජුගේ ද අනුග්‍රහය මේ සඳහා ලැබී ඇති බවත්, මහනුවර යුගයේ දී නැවත ප්‍රතිසංස්කරණය කරන්නට ඇති බවටත් සැලකේ (බුද්ධිකා, 2014:26). ක්‍රි.ව 915 දී පමණ රෝපණය කරන ලද්දක් බවට සැලකෙන බෝධි වෘක්ෂය හා බුදුන් වහන්සේගේ සිරිපා සලකුණු කර ඇති ගල් පතුරු ද මෙහි ඓතිහාසික බව කියාපාන්නකි. එසේ ම ඉපැරණි ලෙන් විහාරයට පිටුපසින් ඇති ක්‍රි.ව 4-5 සියවස්වලට අයත් සෙල්ලිපියේ අවසානයේ අශ්වයකුගේ රූපයට සමාන රූපයක් කොටා ඇති බැවින් "අස්ගිරිය" යන නාමය ලැබෙන්නට ඇතැයි සැලකේ. (බණ්ඩාරනායක, සෝමදේව, 1999:238)



ඡායාරූප අංක 01; (පර්වත මුදුනේ විහාර ගොඩනැගිල්ලට පිවිසීමට ඇති ගල් පඩිපෙල)



ඡායාරූප අංක 02; (අශ්වයකුගේ රූපයක් කොටා ඇති සෙල්ලිපිය)

## මහනුවර යුගයේ සිතුවම්

ඉතිහාසය පිළිබඳ විෂය ක්ෂේත්‍රයේ දී සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ලැබෙන තොරතුරුවලට අමතරව විවිධ කාලපරිච්ඡේදයන්හි නිර්මාණය කරන ලද චිත්‍ර කලා සම්ප්‍රදායන්ගෙන් ලැබෙන දායකත්වය ද සුළුපටු නොවේ. තත්කාලීන සමාජය, සංස්කෘතික තොරතුරු විග්‍රහ කෙරෙන ප්‍රබල ප්‍රාථමික මූලාශ්‍ර ලෙස මෙම චිත්‍ර කලාව පෙන්වාදිය හැකි ය. ප්‍රාථමික අවධියේ සිට වර්ධනය වූ චිත්‍ර කලාව, මහින්දාගමනයෙන් පසු බෞද්ධාගමික පසුබිමක් යටතේ අනුරාධපුර, පොළොන්නරු යුගවල දී වර්ධනය විය. දොළොස් වැනි සියවසෙන් පසු එනම්, මහනුවර යුගයට පෙර පැවති චිත්‍ර කලාව පිළිබඳ තොරතුරු ශේෂවී ඇති හෙයින් තත්කාලීන සමාජය නිරූපනය කරන ප්‍රබල මූලාශ්‍රයක් ලෙස මහනුවර යුගයේ චිත්‍ර කලාවට මූලික ස්ථානයක් හිමි වේ. මෙම සිතුවම් කලාව පුළුල් විෂය ක්ෂේත්‍රයක් වන පරිදි ලක්දිව පුරා ම පැතිර පවත්නා විහාර රාශියක ම දක්නට ලැබේ. මෙම සම්ප්‍රධායේ පැරණි ම චිත්‍ර ලෙස සැලකෙන ගංගාරාම, සුරියගොඩ, දෙගල්දොරුව, මැදවල යන විහාරවලට මෙහි දී විශේෂත්වයක් හිමි වේ.


පුස්කොළ පොතක තීරු මෙන් වමේ සිට දකුණට කතා ශරීරය ගලා යන ආකාරයට සිතුවම් නිර්මාණය කර ඇති මෙම සිතුවම් ශෛලිය තුළ දී හිස් ඉඩ වැසීම සඳහා නෙළුම් මල, කඩුපුල් මල, සීනි මල, වැටකෙයියා මල, කොළ ඉති මෝස්තර යොදාගෙන ඇත. අඛණ්ඩ කථන ක්‍රමයට සිතුවම් නිර්මාණය මෙම සම්ප්‍රධායේ විශේෂ ලක්ෂණයකි. ජීව රූප, ගස් කොලන් ආදිය දක්වා ඇත්තේ එක ම පාද රේඛාවකට වන අතර අඳුර ආලෝකය නොදක්වා පැතිලි වර්ණ යොදා ඇත. සිද්ධියක් ප්‍රකාශ කිරීම හැරුණු කොට මහනුවර යුගයේ සිතුවම් තුළින් සියුම් හැඟීම් ප්‍රකාශ කිරීමක් සිදු නොවේ.

බහුල ලෙෂ ම ජාතක කතා පදනම් කරගෙන සිතුවම්කරණයේ යෙදී ඇති අතර දිව්‍ය ලෝකය, අපාය, මාර පරාජය, සුවිසි විවරණ, සත් සතිය, පසේ බුදුවරු, අටමස්ථාන ආදිය නිරූපණය කිරීම තුළින් මෙම යුගයේ බෞද්ධාගමෙන් පෝෂණය වූ කලාවක් පැවති බවට දැකිය හැක ය (බුද්ධිකා, 2014:48). මෝස්තර සිතුවම්කරණයේ දී ඒවා සංකේතාර්ථ ලෙස භාවිතා කොට ඇත (බුද්ධිකා, 2014:48). නිදසුන් ලෙස, නෙළුම් මල මඟින් නිවන හා පවිත්‍රත්වය, සූර්‍ය්‍ය චන්ද්‍ර මඟින් ස්ථිරත්වය, නාගරූඪ තුළින් ආරක්ෂාව, මත්ස්‍ය හා වෘක්ෂ රූප මඟින් මංගල ලක්ෂණ ද නිරූපණය කිරීමට යොදා ගෙන ඇත (බුද්ධිකා, 2014:49). ඉහතින් දැක් වූ මහනුවර යුගයේ සිතුවම් කලාවට ආවේණික සුවිශේෂී ලක්ෂණවලින් සංගෘහිත වූ ලෙන් විහාරයක් ලෙස මෙම අස්ගිරිය රජමහා විහාරය පෙන්වාදිය හැකි ය.


## අස්ගිරිය රාජමහා විහාරයේ ලෙන් සිතුවම්

අස්ගිරිය රජමහා විහාරයේ ආරාම සංකීර්ණය කොටස් දෙකකින් යුක්ත වේ. එනම් පර්වත මුදුනෙහි පිහිටි විහාර ගොඩනැගිල්ල හා පර්වත පාමුල නිමකර ඇති විහාර සංකීර්ණයයි. පර්වත මුදුනෙහි ඇති ඉපැරණි විහාර මන්දිරයට ඇතුළු වන විට හමුවන

පහත ඉදිරිපස 1 කොටසේ පැරණි බාල්කය හා උළු වහල හැරුණු විට කිසිදු ප්‍රතිමාවක් හෝ සිතුවමක් දක්නට නොලැබේ. වන්දනා කටයුතු සඳහා පමණක් ඉදිකර ඇති මෙහි ආරුක්කු සහිත බිත්ති ලන්දේසි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නිරූපණය කරයි. (බුද්ධිකා, 2014:63).



ඡායාරූප අංක 03; (සිතුවම් සහිත ලෙන් විහාරය)





සැලසුම් අංක 01; (විහාර ගොඩනැගිල්ල)

විහාරගෙට ඇතුළු වන පසුපස කොටස මෙහි මැද කොටස සේ සැලකිය හැකි ය. මෙම කොටසේ බිත්ති වියන සම්පූර්ණයෙන් ම සිතුවම්වලින් අලංකාර කර ඇත. මෙම සිතුවම් සඳහා සත් සතිය, සොළොස්මස්ථාන, හා දෙවියන්ගේ දෙවියන්ගේ රූප ආදිය වස්තු විෂය වී ඇත. මෙහි ඇති සියළු චිත්‍ර මහනුවර යුගයේ චිත්‍ර ශෛලියට අනුගත ව ඇද ඇත. විහාරගෙයි මැද කොටසෙහි ඉදිරිපස දොරටුව හා පිටුපස දොරටුව හැරුණු විට අන් සියළු අවකාශයන්හි බිතු සිතුවම් දැකිය හැකි ය. විහාරගෙට ඇතුල් වීමේ දී මුලින් ම හමුවනුයේ මෙම කොටසේ සිතුවම් ය.

මෙහි සිතුවම් සඳහා තේමා වී ඇත්තේ බුදුන් වහන්සේ හා සම්බන්ධ සිද්ධි මාලාවකි. මුලිකව ම සත් සතිය, සොළොස්මස්ථාන, සිතුවම් කර ඇති අතර රහතන් වහන්සේගේ රූප ද අභය මුද්‍රාවෙන් සිතුවම් කර ඇත (බුද්ධිකා 2014:68). බිත්තිය තීරු දෙකක් වශයෙන් බෙදා සිතුවම් කිරීමේ දී ඉහළ තීරුවෙහි සත් සතිය සිතුවම් කර ඇත. එහි වමේ සිට දකුණට පිළිවෙලින් පළමු සතියෙහි ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කිරීම, යමා මහ පෙළහර පෑම, දෙවන සතිය තුළ අනිමිස ලෝචන පූජාව පැවැත්වීම, තෙවන සතියෙන් බුදුන් වහන්සේ රුවන් සක්මනෙහි යෙදුන අවස්ථාව නිරූපණය කර ඇත (බුද්ධිකා 2014:69). මෙය ජනේලයේ පසුබිම් රේඛාවෙන් මදක් ඉහළට වන සේ සැකසුනු වේදිකාවක ඇද ඇත. බුදුන් වහන්සේගේ රූපය වටා වළාකුළු චිත්‍රණය කිරීමෙන් අහසෙහි වැඩ සිටින ආකාරයට දක්වා ඇත. මෙහි දී විශේෂයෙන් දැකිය හැකි වනුයේ ෂඩ් වර්ණ රශ්මිය විහිදුණු ආකාරය පෙන්වා දී තිබීම ය. මෙම රූප රාමුවේ දී උළු සෙවිලි කළ පියස්සෙහි පෙති උළු කැට වෙන වෙන ම ඇද දක්වා තිබේ. කුළුනුවලට යෙදූ කැටයම් ද

රේඛා කර්මය මගින් සරසා ඇත. මෙහි දෙමහල් ගොඩනැගිල්ල සිත්තම් කිරීමේ දී දෙමාලයෙහි වහල අලංකාර මෝස්තර රටාවන්ගෙන් නිර්මාණය කර ඇති ආකාරයක් දක්නට ලැබේ.




**ඡායාරූප අංක 04;**
**(ගොඩනැගිල්ලක් තුල සිතුවම් කර ඇති බුද්ධ රූපය)**

එක තීරුවක සිද්ධි කිහිපයක් දැක්වීමේ දී අදාල රූප රාමුව වෙන් කිරිම සඳහා ගසක්, මාළිගයක්, වැනි නිර්මාණයන් දැක්වීම මහනුවර යුගයේ චිත්‍ර කර්මයේ ලක්ෂණයකි. ඒ අනුව මෙම සිතුවම් ද මහනුවර යුගයේ ශෛලියට අනුව සිතුවම් කර ඇති බව පැහැදිලි වේ.

පසුපස කොටසේ දකුණු පස බිත්තියේ ඉහළ ජනේලවල පස් වැනි සතියෙහි අජපල් නුගරුක මුල වැඩ සිටීමේ දී බුදුන්වහන්සේ හංසක නම් බමුණාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරයත් තණ්හා, රති, රගා යන මාරදූන් පැරදූ ආකාරයත් දක්වා ඇත. මුචලින්ද නාග දරණය තුළ වැඩ සිටින ආකාරය දැක්වෙන සිතුවම් රාමුවෙහි අවට වළාකුළු දුඹුරු පැහැයෙන් වර්ණ ගන්වා තිබීම නිසා බුදුන් වහන්සේ අකාල මේඝයන්ට මුහුණ දුන් ආකාරයක් නිරූපිත ය. සොලොස්මස්ථාන සුදු දුඹුරු පැහැයෙන් වර්ණ ගන්වා ඇත. කොත් කැරැල්ලෙහි සතරැස් කොටුව සහ දේවතාකොටුව කහ පැහැයෙන් දක්වා තිබේ. සෑම චෛත්‍ය රූපයක ම දකුණ හා වම් පසත් චෛත්‍ය වන්දනාවේ යෙදෙන දේව රූප නිරූපණය කර ඇත. උඩුකය පමණක් නිරූපණ කරන මෙම දේව රූප කහ පැහැයෙන් වර්ණගන්වා ඇති අතර වළාකුළු අතුරින් පැමිණෙන ආකාරයක් දක්වා ඇත. චෛත්‍ය රූප එකිනෙක වෙන් කර දැක්වීම සඳහා කැටයම් යෙදූ ශෛලමය කණුවක් වැනි රූපයක් ද ඇඳ ඇත. මෙම දේව රූපයන්හි ඇස, නහය, කට පැළඳි ආභරණ පවා පැහැදිලි ව දක්වා ඇත.




**ඡායාරූප අංක 05;**
**(සිතුවම් වෙන් කිරීමට මල් පෝච්චි**



**ඡායාරූප අංක 06;**
**(චෛත්‍ය වෙන් කොට දැක්වීමට ලාම්පුවක් සහිත ස්ථම්භයක්)**

ඉහත සැලසුමේ පසුපස කොටසේ එනම් විහාරගෙහි මැද කොටසට පිවිසීමට ඇති දොරටුවට දකුණු පසින් ඇති හරස් බිත්තියෙහි ඉහළ තීරුවෙහි රහතන් වහන්සේ දෙනමකගේ රූප සිතුවම් කර තිබුණ ද වම්පස හරස් බිත්තියේහි ඉහළ තීරුවෙහි රහතන් වහන්සේ රූප තුනක් පමණක් සිතුවම් කර ඇත්තේ ඉඩ ප්‍රමාණය සීමිත නිසා විය හැකි ය. දිග බිත්තිවල ඉහල තීරුවෙහි සම්පූර්ණයෙන් ම සත් සතිය නිරූපණය කල ද පහළ තීරුවෙහි සතර බිත්තියේ සම්පූර්ණයෙන් චෛත්‍ය රූපවලින් සරසා ඇත. සිවිලිමේ සිතුවම් ඇදීම සඳහා කොස් කොහොඹ තේක්ක වැනි ලි භාවිතා කොට ඇත.

සිවිලිමේ සිතුවම් ඇදීමේ දී ලෑල්ලට අමු රෙද්දක් අලවා සිතුවම් අදිනු ලැබූ ස්ථාන ද දැකිය හැකි ය. විහාරයේ මැද කොටසෙහි සිවිලිම දැවයෙන් නිමවා ඇති අතර නෙළුම් මල් මෝස්තර රටා කිහිපයකින් අලංකාර කර ඇත. කළු පසුබිමෙහි රතු හා සුදු නෙළුම් මල් සිතුවම් කර ඇති අතර ලා රත් පැහැලි මල් වටා තද රත් පැහැයෙන් බාහිර රේඛාව ඇද ඇත. සුදු නෙළුම් මල්හි බාහිර රේඛාව රත් පැහැයෙන් ඇද



**ඡායාරූප අංක 07;**
**(සිවිලිමේ ඇඳ ඇති නෙළුම් මල් මෝස්තර)**

තිබේ. නෙළුම් මල් පියනෙහි කෙළවර පිපුණු මල් හා පෙති සහිත ලියවැලකින් අවසන් කර ඇත. රතු නෙළුම් මල් හා සුදු නෙළුම් මල් රටාවකට අනුව මෙහි දී ඇඳ ඇත.

රහතන් වහන්සේ නිරූපණ කරන්නා වූ බොහෝ සිතුවම්වල උන්වහන්සේගේ හිස වටා රැස් වළල්ලක් නිරූපණය කර තිබෙනු දක්නට ලැබේ. එහෙත් සමාධි බුද්ධ ප්‍රතිමාවට ඉදිරිපසින් ඇති බිත්තියේ සිතුවම් කර ඇති රහතන් වහන්සේ නමගේ රූපයේ රැස් වළල්ලක් දක්නට නොලැබෙන අතර ඒ වෙනුවට එම රූපය වටා බිත්තිය වළාකුළුවලින් ආවරණය කර නෙළුම් පොහොට්ටු දැත දරා ආවරණය කර ඇත. සෙසු අවකාශයන්හි අභය මුද්‍රාවෙන් වැඩ සිටින බුද්ධ රූප 28කි. මෙය අටවිසි බුදුරජාණන් වහන්සේ ලෙස දැක්විය හැකි ය. (සුමනසේකර, 2009:65)

සමාධි පිළිමයට වම් පසින් පිහිටා ඇති බිත්තිය තීරු තුනකට බෙදා දක්වා ඇත. ඉහළ තීරු දෙකෙහි බුද්ධ රූපවල සිවුරු සයුරු රැලි ආකාරයටත් පහළ තීරුවෙහි බුද්ධ රූපවල සිවුරු රැලි ආකාරයටත් සිතුවම් කර ඇත. බුද්ධ රූපයන්හි දැත් ඉදිරිපස දෙසට යොමු වී ඇතත් පාර්ශ්වදර්ශී රීතියට අනුව පැත්තට හැරුණු විලාසයෙන් සිතුවම් කර ඇත. (බුද්ධිකා, 2014:94). මෙය මහනුවර යුගයේ සිතුවම්වල ප්‍රකට ලක්ෂණයකි.

### වර්ණ භාවිතය

මෙහි සියලු රූප සිතුවම් කිරීමේ දී සියුම් රේඛා මඟින් අලංකාරත්වය මතු කිරීමට මෙන් ම ඒ තුළින් සිතුවම් තුළ පවතින නොගැඹුරු බව ඇති කිරීමට

උත්සාහ ගෙන ඇත. එසේ ම ප්‍රතිමා සහිත බිත්ති පෘෂ්ඨය ළා නිල් පැහැයකින් වර්ණ ගන්වා ඇති අතර සමාධි ප්‍රතිමාව දෙපස ඉර හඳ නිරූපණය කර තිබේ. ඉර හඳ සිතුවම් ද මෙකල ප්‍රකට සැරසිල්ලක් විය. විහාර මන්දිරයේ සතර බිත්ති හා ගිලාමය වියන සිතුවම් කිරීමට සුදුසු වන පරිදි බදාම තට්ටු යොදා සකස් කරගෙන ඇති බව පෙනේ. බිත්තිවල බදාම තට්ටු අතුරා සිතුවම්කරණයේ යෙදී ඇති බව සිතුවම් කොටස් කැඩී බිඳී ගිය තැන්වලින් පැහැදිලි වේ. අස්ගිරි විහාරයේ සිතුවම්වල ශෛලිය අඛණ්ඩ කථන ක්‍රමය බව සේනක බණ්ඩාරනායක විසින් ප්‍රකාශ කර ඇත. (බණ්ඩාරනායක, සෝමදේව, 1999:237). එනම්, කතා නායකයා නැවත නැවත යොදා ගැනීමය. මෙම සිතුවම්වල ද කතා නායකයා සෑම රූප රාමුවකටම යොදා ගෙන ඇති බව දැකිය හැකි ය. මෙම විහාරයේ සිතුවම් සඳහා මූලික ලෙස ම රතු, කහ, දුඹුරු, හා කළු පැහැ වර්ණ භාවිත කරමින් නිර්මාණය කර ඇත. සමකාලීන යුගයේ සිතුවම් සඳහා වර්ණ සකසා ගත් ආකාරයට ම ගස්වල කොළ, පොතු ආදිය අඹරා සකස් කර ගැනීමෙන් ද පස්, අඟුරු ආදිය අඹරා ගැනීමෙන් ද වර්ණ සකසා ගන්නට ඇත. (බුද්ධිකා, 2014:95). ප්‍රතිමා සහිත ගෘහයේ නෙළුම් මල් මෝස්තරය සංරක්ෂණය කිරීමේ දී එහි පැවති මූලික ස්වරූපය වෙනස් වී ඇත. එහෙත් රේඛා කර්ම මඟින් ඇඳි මෝස්තර රටාවල වෙනසක් සිදු වී නොමැත.

## සමාලෝචනය

පහතරට ඇද ඇති මහනුවර යුගයේ සම්ප්‍රදායට අයත් සිතුවම් පිළිබඳ ව සැලකිලිමත් වීමේ දී විදේශීය ආක්‍රමණ හේතුවෙන් තාඩන පීඩනවලට ලක්වූ ජනයාගේ හැඟීම් මෙම සිතුවම්වලට මුසු වී ඇති බව දැකිය හැකි ය. අස්ගිරිය රාජමහා විහාරයේ මෙම සිතුවම් තුළින් ද සමකාලීන සමාජය නිරූපණය වන බව පෙනේ. නිදසුන් ලෙස, සිතුවම් එකිනෙක වෙන් කිරීම සඳහා මල් පෝච්චි සිතුවම් හා ලාම්පු සහිත ස්තම්භ සිතුවම් ඇඳ දක්වා තිබීම පෙන්වාදිය හැකි ය. මෙම සිතුවම් විවිධ සිත්තරුන් විසින් අඳිනු ලැබූ ඒවා හෙයින් ද එකිනෙක සිත්තරුන්ට ආවේණික වූ ශිල්පීය ක්‍රම ඇති හෙයින් ද මෙම විහාරයෙහි සිතුවම්වල ශෛලියෙහි වෙනසක් දැකිය හැකි ය. කෙසේ නමුත් ශිල්පීය ලක්ෂණ අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ, මහනුවර යුගයේ සිතුවම්කරණයේ දක්නට ලැබෙන ශෛලීගත ලක්ෂණයන් ප්‍රකට කරන කලාත්මක වශයෙන් උසස් සිතුවම් දක්නට ලැබෙන ගම්පහ දිස්ත්‍රික්කයේ විශේෂ විහාරස්ථානයක් ලෙස අස්ගිරි රජමහා විහාරය පෙන්වාදිය හැකි ය.